ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2149/17 - 2019 නොවැම්බර් මස 13 වැනි බදාදා - 2019.11.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ, මඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ශුද්ධ වූ මඩු මාතාවන්ගේ දේවස්ථාන භූමිය, ශ්‍රී ලංකාද්වීපයේ මෙන්ම ලෝක වාසී අතිමහත් කතෝලික බැතිමතුන්ගේ ඉමහත් ගෞරවාදරයට පාත්‍රව ඇති හෙයින් ද, මෙකී ශුද්ධ වූ මඩු මාතාවන්ගේ දේවස්ථානය වන්දනාමාන කිරීම පිණිස පැමිණෙන කතෝලික බැතිමතුන්ගේ සුව පහසුව සලසනු වස් අවශ්‍ය වන්නා වූ පූර්ණ පහසුකම් සැලසීමෙ අභිලාශයෙන්, 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) හා 21(2)(ආ) වගන්ති යටතේ, අංක 2145/55 හා 2019.10.19 දිනැති *ගැසට් නිවේදනය* මගින් ශුද්ධ වූ මඩු මාතාවන්ගේ දේවස්ථාන භූමිය ආශ්‍රිතව නාගරික සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කර ඇති හෙයින් ද,

තවද, එකී මඩු වන්දනා සමය තුළ දී ශුද්ධ වූ මඩු වන්දනා ප්‍රදේශය වෙත පැමිණෙන්නා වූ සුවහසක් ජනයා අසීරුතාවයට පත් නොවන සේ රැඳී සිටීමට අවස්ථාව සැලසීමේ අපේක්ෂා පෙරදැරිව, 1896 අංක 13 දරන වන්දනා ගමන් ආඥාපනතේ 2 වගන්තිය යටතේ මඩු වන්දනා රෙගුලාසි, 1982 මාර්තු මස 19 වැනි දිනැතිව අංක 185 *ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශයට පත් කර ඇති අතර, එකී රෙගුලාසිවලට අනුකූල වන ලෙස ද,

තවද, අංක 1779/15 හා 2012.10.10 දිනැති *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද මඩුපාර රක්ෂිත වනාන්තරය සහ අංක 1920/3 හා 2015.06.22 දිනැති *ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත මඩු පාර ජාතික උද්‍යානය තුළට මෙකී භූමි ප්‍රදේශය ඇතුළත් වන බැවින්, 1885 අංක 10 දරන වන සංරක්ෂණ ආඥාපනත, 1937 අංක 02 දරන වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥාපනත හා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යන පනත් මගින් පනවා ඇති විධිවිධානයන්ට යටත්ව මෙම භූමිය පරිහරණය කළයුතු බව අවධාරණය කරමින් ද,

1A - G 31455 — 27 (2019/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධ වූ මඩු මාතා දේවස්ථානයට වන්දනා මාන කිරීම පිණිස පැමිණෙන සුවහසක් වූ කතෝලික බැතිමතුන්ගේ ආගමික සුභ සිද්ධිය සැලසීම පිණිස පළමු උපලේඛනයේ දැක්වෙන භූමි ප්‍රදේශය පූජාභිවන්දනා ප්‍රදේශයක් ලෙසට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(2)(උ) අනු ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව ප්‍රකාශයට පත් කරමි.

වර්ෂ දෙදහස් දහනවයක් වූ නොවැම්බර් මස 11 වැනි දින කොළඹ දී ය.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

උදය ආර්. සෙනෙවිරත්න,
ජනාධිපති ලේකම්.

උපලේඛන 01

උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ, මඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මඩු ග්‍රාම නිලධාරී වසමේ මඩු ගමෙහි පිහිටියා වූ ද සර්වේයර් ජනරාල් තැන විසින් පිළියෙල කරන ලද අනුරේඛන අංක Ma/MDU/2018/185 හි කැබලි අංක A, B, C, D, E සහ F වශයෙන් පෙන්වා තිබෙන්නා වූ ද හෙක්ටයාර් දෙදහස් එකසිය හැටයි දශම තුනයි හතරයි තුනයි දෙකක් (හෙක්ටයාර් 2160.3432) විශාලයැයි ගණන් බලනු ලැබුවා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉඩම් කොටස වේ.

11 - 1607

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.